# හැල කිඹුලා පස්සෙන් පැන්නුවා

මේ සිද්ධිය වුනේ මාව රස්සාවට බඳවා ගත්ත කාලේ.

විල්පත්තු වනය අඩවි අටකට බෙදලා තියෙනවා. මට රැකියාව ලැබුණේ 'පොම්පරිප්පුව' කියන අඩවියේ, 3 ශ්‍රේණිය වන අඩවි ආරක්ෂක වරයෙක් විදිහට.

මේ කාලේ ක්ෂේත්‍ර වැඩ වලට අපට රජයෙන් වාහන ලැබුණේ නෑ. අපි ගමන් කළේ පයින් නැත්නම් පා පැදි වලින්.

මේ මාර්ගයේ පරණ වෙල් යායක් තිබුණා. ඒ හරහා කොහොමටවත් වාහන යන්න බැහැ. ඊට අමතරව කිලෝමීටර් විස්සක් තරම් දුරට වැල්ල.

අපි වැටලීමක් කළොත් වරදකරුවන් උසාවියට ඉදිරිපත් කරනවා. ඒ දවස්වල වරදකරුවන් උසාවියට දාන්න අපිට විල්පත්තු ප්‍රධාන දොරටුවෙන් වාහනයක් ගන්න පුළුවන්. උසාවි දැම්මට පස්සේ උසාවි දින වලට අපි යන්නේ පයින්.

මම වැඩ කරපු පොම්පරිප්පුව අඩවියේ ඉඳලා විල්පත්තු ප්‍රධාන දොරටුවට කිලෝමීටර් හතලිස් හයක් දුර තියෙනවා.

උසාවි යන දවසට අපි පාන්දරින් නැගිටලා කිලෝමීටර් හතලිස් හයක් පයින් යන්න අරඹනවා. බෑගයක අපිට අවශ්‍ය ලිපිද්‍රව්‍යත් අනෙක් උවමනා කරන ජාතිත් දාලා පිටේ එල්ලා ගන්නවා.

පොම්පරිප්පුවේ ඉඳලා කිලෝමීටර් හතකට දුරින් තලවිල බංගලාව තියෙනවා. එතැන ටිකක් විවේක අරගන්න පුළුවන්. ඉන් පස්සේ කිලෝ මීටර් තිස්නවයක් පයින් යනවා විල්පත්තු ප්‍රධාන දොරටුවට. ඒ හරියට කියන්නේ හුණුවිලගම කියලා.

තලවිල බංගලාව පහු කරලා එනකොට වැලි තියෙන ප්‍රදේශයේ ' කොක්කාරිය ' විල හමු වෙනවා. මේ විලේ තියෙන්නේ කලපු වතුර. විල ළඟින් යන වැලි පාර එරෙනවා.

දවසක් මම උදේ පාන්දර ආවා උසාවි යන්න. වෙලාව උදේ හයට විතර ඇති. යාන්තමින් ඉර එළිය වැටී තිබුණා. මගේ අතේ ආයුධයක් තිබුණේ නෑ. වල් සතුන් හය කරන්න පාවිච්චි කරන ආලෝක වෙඩි (තන්ඩ ප්ලෑෂ්) දෙක තුනක් විතරක් තිබුණා ආරක්ෂාවට. පැත්ත පලාතක කවුරුත් පේනන හිටියේ නෑ.

මම විල ළඟින් එනකොට එකපාරටම විශාල කිඹුලෙක් විල ගැට්ටේ ඉඳලා මං ඉස්සරහට පැන්නා. මේ හැල කිඹුලෙක්. අඩි පහළොවක් විතර දිගයි. වාසනාවට මාව අහුවුණේ නෑ, මම පැන ගත්තා, පස්සේ දුවන්න පටන් ගත්තා. වැලි පාර එරෙනවා. නමුත් අමාරුවෙන් දිව්වා. පස්සේ හැරිලා බලනකොට කිඹුලා මගේ පස්සෙන් එළවනවා. මාව වෙව්ලන්න ගත්තා. නමුත් මට දුව ගන්න පුලුවන් වුනා. කිඹුලා මගේ පස්සෙන් මීටර් අටක් විතර දුරට එලෙව්වා.

ඉන්පස්සේ මම මේ පාරේ යනකොට කිඹුලෝ ගැනත් විශේෂයෙන් බැලුවා.

**වෙහාන් සහන්ජිත් වේරගම**



වයස අවුරුදු විස්සටත් අඩු තරුණයකුසේ 1981 නොවැම්බර් දෙවැනිදා 3 වන ශ්‍රේණිය වන අඩවි ආරක්ෂක වරයකු ලෙස වනජීවි දෙපාර්තමේන්තුවට බැදුණු සහන්ජිත් වේරගම මහතා අද වන විට 2 ශ්‍රේණිය හා 1 ශ්‍රේණිය කාර්යක්ෂමතා කඩඉම් පසු කර අනුරාධපුර කලාප සහකාර අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරනු ලබයි.

බිරිඳගෙන්ද, දියණියකගෙන්ද පුතනුවන් දෙදෙනකුගෙන්ද සමන්විත වේරගම මහතාගේ ආදරණීය පවුල නුවර දිස්ත්‍රික්කයේ ගලගෙදර ප්‍රදේශයේ පදිංචිව සිටින අතර ඔහු අනුරාධපුර නිල නිවසේ සිට රාජකාරී කටයුතු කරනු ලබයි.

# <u>කහල්ලේ පල්ලේ කැලේ අභය භූමිය</u>

කහල්ලේ පල්ලේ කැලේ අභය භූමිය උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රිකයට අයත් කලගම් පලාත, පලාගල සහ කැකිරාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය සහ වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රිකයේ ගල්ගමුව සහ පොල්පිතිගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය පුරා පැතිර තිබේ. මෙම අභය භූමියෙහි ගිණිකොණ දිශාවෙන් මධ්‍යම පලාතේ මාතලේ දිස්ත්‍රිකයේ මායිම පිහිටා ඇත.

මෙහි මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 216.9 නැතහොත් හෙක්ටයාර් 26690 ලෙස 1980 ජූලි පළමු වන දින ප්‍රකාශයට පත් කර ඇත. මෙහි පිහිටිම අනුව අභය භූමිය වටා ජනාවාස පිහිටා ඇති අතර හක්වටුනා ඔය සහ සියඹලාංගමුව වැව මේ ආශ්‍රිතව පිහිටා තිබේ. ඉබ්බන්ගමුව සිට පොල්පිතිගම හරහා මොරගොල්ලාගම දක්වා දිවෙන මාර්ගයද ගලේවෙල සිට නෑගම දක්වා දිවෙන මාර්ගයද අභය භූමිය වෙත ලගා විය හැකි ප්‍රධාන මාර්ග වේ. මඩාටු ගම, කලා වැව හරහා කැකිරාව මාර්ග සම්බන්ධ කර අතුරු මාර්ග රාශියක් මෙම අභය භූමිය වටා දිවෙයි. රිටිගල රක්ෂිතයද මෙම අභය භූමියට ආසන්නව පිහිටා ඇත.

මෙම ප්‍රදේශයේ මහවැලි **"එච්"** කලාපය යටතේ ජනාවාස බිහිවීමත්, කෘෂිකාර්මික කටයුතු සහ සංවර්ධන කටයුතු සිදු විම හේතුවෙන් වාසස්ථාන අහිමි වු වන අලි ඇතුළු වනජිවින්ට වාසස්ථාන ලබාදිමේ අරමුණින් හක්වටුනා ඔය, කලා වැව සහා බලලු ඔය ආශ්‍රිතව මෙම අභය භූමිය ප්‍රකාශයට පත් කෙරිනි.

කහල්ලේ පල්ලේ කැලේ අභයභූමිය එහි ප්‍රමාණය හා සැලකිමේදි ඉතා විශාල ජෛව විවිධත්වයකට හිමිකම් කියයි. වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන අභය භූමියක් තුල රජයේ ඉඩම් මෙන්ම පුද්ගලික ඉඩම්ද පිහිටා තිබිය හැකිය. එහෙත් එම පුද්ගලික ඉඩම් තුල ඉදිකිරිමක් හෝ යම් සංවර්ධන ක්‍රියාවක් සිදු කරන්නේ නම් ඒ සඳහා වනජිවි අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු වේ. කහල්ලේ පල්ලෙකැලේ අභයභූමිය තුල ගම්මාන 50 ක් පමණ පිහිටා ඇති අතර අභයභූමි මායිම වටා ද ගම්මාන රාශියක් පිහිටා තිබේ. මේ සියළු ගම්මාන, අභය භූමිය ප්‍රකාශයට පත් කිරිමට පෙර සිටම පැවති ගම්මාන වේ. මෙම පැරණි ගම්මාන කුඩා වැව් ආශ්‍රිතව පිහිටා ඇති අතර පොල්, කෙසෙල්, පලතුරු ආදි ගෙවතු වගාවන් ද මෙහිදි සිදු වේ.

වසර පුරා වියළි දේශගුණයක් දක්නට ලැබෙන අතර , මෙම අභය භූමියේ වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 32 ක් පමණ වේ. වර්ෂයේ අප්‍රේල්-මැයි සහ ඔක්තෝබර්-නොවැම්බර් මාස වලදි වර්ෂාපතනය ලැබෙන අතර ජූනි සිට සැප්තැම්බර් අග දක්වා දිගු වියළි දේශගුණයක් පවති. නොවැම්බර් - ජනවාරි දක්වා මෝසම් වර්ෂාව ලැබේ. වාර්ෂික වර්ෂාපතනය මි:මි 1450 සිට 1650 ත් අතර වේ.

කහල්ලේ පල්ලේකැලේ අභය භූමිය තුල ප්‍රධාන දිය පහර හතරක් දකින්නට ලැබේ. කහල්ලේ නැගෙනහිර බෑවුමෙන් මොරගොල්ල ඔය **කලාවැව** වෙත ගලා බසි. දකුණු බෑවුමෙන් හක්වටුනා ඔය ගලා බසින අතර පල්ලේකැලේ බටහිර බෑවුමෙන් මී ඔය ගලා බසි. මෙහි ප්‍රධාන ජල ප්‍රභවය

සියඹලාන්ගමුව ඔයයි. මෙයට අමතරව බලලු වැව, බෝගහපත්තුව වැව, ආඩියාගල වැව, දිවුල් වැව, උල්පත් වැව, රම්බෑව වැව, මිල්ලගොඩ වැව ආදි වැව් රාශියක් කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදිකර තිබේ.



**කලා වැව**

මෙම අභය භූමිය තුල ශාඛ විශේෂ 256 ක් දක්නට ලැබෙන අතර මෙහි උස් වියන් සහිත ප්‍රාථමික වනාන්තර , පහත් වියන් සහිත කඳු වැටි , මධ්‍යම ස්ථර සහිත වනාන්තර , පදුරු බිම්, තෙත් බිම්, කුඹුරු, කඳුවැටි ආදි පරිසර පද්ධති දක්නට ලැබේ. මෙම පරිසර පද්ධති ඇසුරු කර ගත් විශාල සත්ත්ව විශේෂ රාශියක් මෙහිදී දක්නට ලැබේ. මෙම අභයතුල ඖෂධ ශාඛ රාශියක් පවති. ඒ අතර සුදු හඳුන්, අරළු, බුළු,මී, ඔලිද, එලබටු, එලනැදුන්, වද කහ ,රසකිඳ, කොහොඹ, කෝමාරිකා, ආඩතෝඩ, කපු කිනිසි, වෙනිවැල්, වැටකේ සහ වල් කඳුරු ආදි ඖෂධ ශාඛ ප්‍රධාන වේ.



ක්ෂීරපායි විශේෂ, උරගවිශේෂ, උභයජීවින්, පක්ෂි විශේෂ, සමනළයින්, කෘමීන්, ගොළුබෙලි විශේෂ රාශියක් දක්නට ලැබේ. අලියා, වලහා, කළු වඳුරා, කොටියා, මී මින්නා උණහපුළුවා, කලවැද්දා, කබල්ලෑවා මෙහි තර්ජනයට ලක්වි ඇති ජීවි විශේෂ ලෙස වාර්තා වේ. මුවා, ගොනා, කුළුහරක්, රිලවා, නරියා, හෝතම්බුවා, ඉත්තෑවා, දඩුලේනා ආදිසත්ව විශේෂ මෙහි ජීවත් වෙති. කහල්ලේ පල්ලේ කැලේ අභය භූමිය තුල අලි 150 - 200 ක් පමණ ජීවත් වන අතර දළ ඇතුන්දජ් අතර වේ. අත්හරින ලද හේන් , වැව් තාවුලු සහ තේක්ක වගාවන් අලින්ගේ ප්‍රියතම වාසස්ථාන වේ. දිවා කාලයේදි අලි, ලඳු කැළෑ ආශ්‍රිත ගස් සෙවනේ නිදහසේ ගත කරයි.



සවස් කාලයේදි වැව් තාවුළු වල පිහිටි තණ බිම් කරා පැමිනෙණි ඔවුන් වැව් වලින් ජල අවශ්‍යතා සපුරා ගනි. තණ බිම් මෙන්ම තේක්ක වගාවන්ද ඔවුන්ට කදිම ආහාර සපයයි.

මෙම අභය භූමිය තුල විශාල මුව ගහණයක් ද ගෝන්නු රංචු කිහිපයක්ද දැකිය හැකිය. ඔවුන් පහල ස්ථර සහිත වනාන්තරයේ මෙන්ම ඉහල ස්ථර සහිත වනාන්තර වලදිද දැකිය හැකිය. කොටි හත් අට දෙනෙකු

මෙන්ම වලසුන් කිහිප දෙනෙකු මෙහි ජීවත් වෙති. ශ්‍රී ලංකාවේ කුරුළුවිශේෂ 427 ක් පමණ වාර්තා වන අතර ඉන් 189 ක් පමණ පර්යටන පක්ෂීන් වේ. ශ්‍රී ලංකාවේ බිජුලන පක්ෂි විශේෂ 236 ක් පමණ ජීවත් වන අතර ඉන් 34 දෙනෙකු ශ්‍රී ලංකාවට ආවේණික වේ. කහල්ලේ පල්ලේ කැලේ අභය භූමියේදි දේශිය මෙන්ම පර්යටන පක්ෂීන් රාශියක් හඳුනා ගත හැකිය. මෙම පක්ෂි විශේෂ අතරින් රාශියක් ඉහල ප්‍රාථමික වනාන්තර තුලදි දැකිය හැකි වේ. හේන් භූමි, ලඳු කැළෑ, තේත් බිම් සහ ජලාශ ඔවුන්ගේ වාසභූමි වේ.

ශ්‍රී ලංකාවේ උරග විශේෂ171 ක් පමණ වාර්තා වන අතර ඉන් 75 ක් පමණ ආවේණික වේ. කහල්ලේ පල්ලේ කැලේ අභය භූමියේදි උරග විශේෂ රාශියක් දැක ගත හැකි අතර එහි දි අවේණික උරග විශේෂ රාශියක් තර්ජනයට ලක් වි තිබේ. ශ්‍රී ලංකාවට අවේණික සියළු සත්ත්ව විශේෂ අතරින් 45% ක් උරග විශේෂ වේ. තාරකා ඉබ්බා, තලගොයා, කබරගොයා, කිරි ඉබ්බා, කටුසු විශේෂ, කිඹුලා මෙන්ම හූනු විශේෂ රාශියක් මෙහිදි දැකිය හැකිය. එසේම වැලි පොළගා , පිඹුරා, නාගයා ආදි සර්ප විශේෂද මෙහි බොහෝ වෙති.

ශ්‍රී ලංකාවෙ  මත්සයවිශේෂ 82 ක් වාර්තා වේ. මේ අතරින් විශේෂ 20 ක් කහල්ලේ පල්ලේ කැලේ අභය භූමියෙන් වාර්තා  වන අතර ඉන් විශේෂ 4 ක් ආවේණික විශේෂ වේ. සමනල විශේෂ 47 ක් කහල්ලේ පල්ලේ කැලේදි හමු වේ. ඉන් 5 ක් ආවේණික විශේෂ වන අතර විශේෂ 3 ක් අන්තරයට ලක්ව ඇත. බ්ලූ මෝමන්ට්, කොමන් බැන්ඩඩ්පීකොක්, බ්ලූඅද්මිරාල් මෙසේ අන්තරායට ලක් වූ විශේෂ වේ. කොමන් ඉන්දියන් ක්‍රෝ, බුෂ් බ්‍රවුන් මෙහිදි හමුවන ආවේණික විශේෂ වේ. මෙවැනි සමනල විශේෂ රාශියක් අභය භූමිය තුල ලඳු කැලෑ ආශ්‍රිතව දැකගන්නට ලැබේ.

කහල්ලේ පල්ලේ කැලේ අභය භූමිය වයඹ සහ උතුරු මැද පලාත අතර පිහිටි ඉතා වටිනා අභය භූමියකි. විශේෂයෙන්ම අලි ඇතුළු සත්ව විශේෂ රාශියකට වාසස්ථාන සපයන මෙම අභය භූමිය එම ප්‍රදේශයේ වන ජීවින් සඳහා වූ හිතකර පරිසර පද්ධති රාශියකින් සැදුම් ලත් අභය භූමියකි.



මෙම අභය භූමියට පවත්නා ප්‍රධානතම තර්ජනය නම් , මෙහි භූමිය කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කිරිමයි. ඒ සඳහා වනය එළිපෙහෙළි කිරිමට පදිංචිකරුවන් ක්‍රියා කිරිම නිසා වන සතුනට වාසස්ථාන අහිමි විමේ තර්ජනයක් පවත්නා අතර එමගින් අලි මිනිස් ගැටුමද උග්‍ර වේ. එසේම කිරිගවයින් ඇතුළු ගව පට්ටින් අභය භූමි තුලට යැවිම හේතුවෙන් අලි ඇතුන් ඇතුළු අනෙකුත් වන සතුන්ට ආහාර හිගයකට මුහුන දිමට සිදුවේ. එසේම අභය භූමිය තුල සත්ත්ව දඩයම වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂ ආඥා පනතට අනුව තහනම් ක්‍රියාවක් වුවත් අඩුවැඩි වශයෙන් සත්ත්ව දඩයම තවමත් මෙහිදි ඉදහිට හෝ සිදුවනු දක්නට ලැබේ. එසේම නීති විරෝධි ලෙස ගස් කැපිමත්, ඖෂධ සඳහා ශාඛ ලබා ගැනිමත් හේතුවෙන් පරිසර පද්ධතියට හානි පැමිණිම සිදු වේ. අනවසරයෙන් වැලි ගොඩ දැම්ම , දර සඳහා ගස් කැපිම ආදි වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතට විරෝධි ක්‍රියා සිදු කිරිම හේතුවෙන් අභය භූමිය තුල පවත්නා ස්වභාවික සම්පතට හානි පැමිණිමත් ඒවා හීන වි යාමත් සිදු වේ. අභය භූමිය විවිධ සංවර්ධන ක්‍රියා සඳහා යොදා ගැනීමට උත්සාහ කිරීමත් , මෙහි භූමිය අනවසරයෙන් අත්පත් කර ගැනීමට උත්සාහ කිරිමත් මෙම අභය භූමියට පවත්නා තවත් තර්ජනයකි.

ජාතික උද්‍යාන වල මෙන් අභය භූමිය තුල සංචාරක ක්‍රියාවලිය සිදුකිරිමට වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතින් ප්‍රතිපාදන නොමැත. අභය භූමියක් යනු මුළුමනින්ම වන සතුන්ගේ වාසස්ථාන ආරක්ෂා කරන ස්ථානයකි. අභය භූමියක් තුල වන සතුන්ගේ වාසභූමි වලට හානි පමුණුවන ආකාරයෙන් යමක් සිදුකිරිම, කැදලි විනාශ කිරිම , පැටවුන් සහා බිත්තර විනාශ කිරිම , සතුන් ඝාතනය කිරිම මුළුමනින්ම තහනම් වේ.



## <u>විල්පත්තු ජාතික උද්‍යානය</u>

ශ්‍රී ලංකාවේ වනජීවි රක්ෂිත ප්‍රදේශ 1938 දි වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇත. වනජීවි රක්ෂිතය කොටස් කිහිපයක් වේ.

1) ජාතික උද්‍යානය
2) දැඩි ස්වාභාවි රක්ෂිතය.
3) ස්වභාවික රක්ෂිත
4) අභය භූමි

මින් පළමු කොටස් තුන රජයේ ඉඩම් පමණක් ඇතුලත් වන අතර ඒවා "ජාතික රක්ෂිත භූමි" ලෙස හැදින්වේ.අභය භූමියකට රජයේ ඉඩම් හා පෞද්ගලික යන දෙවර්ගයේම ඉඩම් ඇතුලත් විය හැකිය. දැනට දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට දහ හතරක පමණ "වනජීවි රක්ෂිත" ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

මෙම රක්ෂිත ප්‍රදේශ වලින් මහජනතාවට වඩාත් සමීප වන්නේ "ජාතික උද්‍යානයි" . ඒ ඒවායේ ජීවත් වන සතුන් දැකබලා විනෝද වීමට මහජනතාවට අවශ්‍ය පහසුකම් සලසා ඇති බැවිනි. ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන විසි හයක්වේ. රජයේ ඉඩම් පමණක් ඇතුලත් වන බැවින් විල්පත්තු උද්‍යානයද "ජාතික රක්ෂිත භූමියක්" ලෙස සැලකේ. කොළඹ සිට විල්පත්තු ජාතික උද්‍යානයට ඇති දුර කිලෝමීටර්ම 180 ක් පමණවේ.



**උද්‍යාන පිවිසුම**






**උද්‍යාන මූලස්ථානය**

වගා කළ නොහැකි තරමටම වගුරක්ව පවතින භූමිය "විල්ලුව" වේ. උස් බැම්මක් මෙන් පිහිටා ඇති මැද පහත් වූ මෙම විල්ලු ප්‍රදේශය වැසි කාලයට ජලයෙන් පිරී පවතී. "පත්තුව" යනු ගම් කිහිපයක්, තුලාන් කිහිපයක් හෝ වසම් කිහිපයක් එකතු සැදෙන සීමා නියාමය . ඒ අනුව බොහෝ විල්ලු පැවතිම නිසා මෙ ප්‍රදේශයට "විල්පත්තුව" යන නම යෙදේ.



**කාල විල්ලු**

කළමණාකරන පහසුව සඳහා විල්පත්තුව කොටස් දෙකකට බෙදා වෙන් කර ඇත.

1) විල්පත්තු ජාතික උද්‍යානය

11) විල්පත්තු උතුරු අභයභූමිය

විල්පත්තු ජාතික උද්‍යානයේ ප්‍රදේශ හෙක්ටයාර් 131667.1 ක් වේ. විල්පත්තු උතුරු අභයභූමියට හෙක්ටයාර් 624 අයත් වේ.

මෙම භූමියන් පොදුවේ ගත් කළ තෘණ භූමි , ලඳුකැළෑ ,වැලිපර, ජාලාශ, වැව් සහිත වනාන්තරයකි. ජනවාරි පෙබරවාරි මාසවල වියළි දේශගුණික තත්වයක් පවතින අතර මාර්තු අප්‍රේල් දක්වා අන්තර් මෝසම් වැසි ලැබේ. මැයි මස සිට සැප්තම්බර් මුල් කාලයේ නෙත් වියළි දේශගුණික තත්වයක් හටගෙන දිගු නියන් සමයක් ඇති වේ. පසුව සැප්තැම්බර් දෙසැම්බර් දක්වා කාලයම වර්ෂාව පවතී. සමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක27.2 කි. වාර්ෂික වර්ෂා පතනය මිලි මීටර් 1000 කි.

විල්පත්තු උද්‍යානයට විල්ලු හතලිහක් පමණ අයත්ව තිබේ. මේවා වැඩි වශයෙන් මිරිදිය වේ. මතුපිටින් මුහුද හා සම්බන්ධ නැති වුවද මින් සමහරක් ලවණ ගතියෙන් යුක්තය. විවිධ වර්ගයේ ජලාශ්‍රිත පක්ෂීන් හා ක්ෂීරපායින් ඒකරාශි වී සිටින විල්ලු වටා පිහිටා ඇති පළල් බෑවුම් සහිත වෙරළ වැනි තීරු අගනා “ පෝෂක ප්‍රදේශ” ලෙස නම් කරනු ලැබේ. මේවා ප්‍රධාන විල්ලු ලෙස හඳුනා ගනී.

විල්පත්තු ජාතික උද්‍යානය තුළ ඇති වගුරු බිම් කාලයකට වියළි යන ගංගා වලින් වෙන් වූ පිටාර තැනි නියෝජනය කරයි. මෙහි වෙරළේ සිට ආසන්න වශයෙන් කිලෝමීටර් විසි හතරක් පමණ ප්‍රදේශයක පවතින හුණුගල් යාපන අර්ධද්වීපයේ පවතින හුණුගල් වලට වඩා වෙනස් බවද හඳුනාගෙන ඇත. පහත් බිම් බටහිර තීරුවද මුහුදු වැල්ලෙන් සමන්විත වන අතර එහි අවසාදිත පාෂාණ ද බහුලය. පලගතුරායි සහ කුදිරමලෙයි අතර පිහිටි වැලි සහ රතු පස් පර්වතද ශ්‍රී ලංකාවේවෙනත් ප්‍රදේශයන්හි පහසුවෙන් හමු නොවන ඒවාය. මෙහි මධ්‍ය ප්‍රදේශයේ ස්වභාවික දිය වලවල් වලින් හා විල්ලු වලින් ගහණය.

බටහිර තීරයේ පස බොහෝ නිසරු අතර එහි තැනින් තැන **රතුකහ** ලක්ෂණ දැකිය හැකිය. ඒවා කාබනික හා ඛණිජ ද්‍රව්‍යන්ගෙන් ඌන ය. නැගෙනහිර ප්‍රදේශයේ පස සරුසාර අතර එහි ඛණිජ ද්‍රව්‍ය අඩංගු වේ. ඒවා වර්ණයෙන් **රතුපාට** හා **දුඹුරු** පාට වේ.



**කුදිරමලේ තුඩුව**

භූගෝලීය පිහිටීම ලෙස මෙය අනුරාධපුරයේ සිට කි.මී 30 ක් බටහිරින් වයඹ දිග වෙරළ තීරයේ පිහිටා ඇත. එසේම වයඹ පළාත හා උතුරු මැද පළාත් අතර මායිම් පුරාද පැතිර පවතී. උතුරින් මෝදරගම් ආරු

මගින්ද දකුණෙන් කළා ඔයෙන් ද බටහිරේන් පෘතුගීසි හා ලන්දේසි බොකු වලින් ද විවෘත මුහුදෙන්ද මායිම් වේ.

අභයභූමිය වෙරළේ සිට අභ්‍යන්තරය සම්පූර්ණයෙන්ම උතුරු පළාතේ පිහිටියකි. එය උද්‍යානයට යාබද ව මෝදරගම් ආරු මගින් වෙන් වී තිබේ.

විල්පත්තුව ශ්‍රී ලාංකිකයන්ගේ ඓතිහාසික භූමියක් ලෙස ද සැලකේ. ඒ විජය කුමරු විල්පත්තුවෙ එක් මායිමක් වන තම්බපණ්ණි නොහොත් කුදිරමලෙයි වරායට අහම්බෙන් ගොඩ බැසිමත් සමගය. ඒ අනුව දිවයිනේ ජනාවාස ආරම්භයේ තෝතැන්නට පමණක් නොව රාජ්‍ය සංස්කෘතියේ පදනමද වැටි ඇත්තේද මේ ප්‍රදේශයේ විය හැකිය. අනුරාධපුරය, පුත්තලම හා මන්නාරම දිස්ත්‍රික්ක වලට අයත් විල්පත්තුව තුළ බහුලව පුරාණ නටබුන් පූරාවෘත්ත හා ජනශ්‍රැති බොහෝ වේ.





**කුවේණි මාලිගාවේ නටබුන්**

පුරාවෘත්තයන්ට අනුව විජය කුමාරයා අවාහ කරගත් කුවේණියගේ මාලිගයේ නටබුන් අද "කාලි විල්ලු" ප්‍රදේශයේ දක්නට ලැබේ. එසේම මීට වසර දෙදහාසකට පෙර දුටුගැමුණු රජුගේ පුත් සාලිය කුමරු හා මනාලිය වු අශෝකමාලා ජීවත් වුයේ යැයි කියන රජමාලිගය , දියපොකුණු, රාජසභා මණ්ඩප වල නටබුන් ආදිය ද තවමත් මරදන්මඩුව ඊසාන දිග පෙදෙසේ පිහිටි වීරන්ගොඩ හා ගල් බැදි තිරය පෙදෙස් වලට අයිතිව පවතින බව පූජ්‍ය එල්ලාවල මේධානන්ධ හිමිගේ කෘතියක සඳහාන් වේ. එනම් ක්‍රි:පූ 161-131 පමණ ඉදිකරණ ලද විලදාගොඩරාජධානිය ඇත්තේ මෙම ප්‍රදේශයේය. පුත්තලම අනුරාධපුර පාරේ සැතපුම් 17 ක් පමණ ගිය විට හමුවන අලුත්ගම හංදියෙන් විල්පත්තු අභයභූමි මායිමේ රාජධානිය පිහිටා ඇත. සාලිය කුමරු විසින් සාදවන ලද "විළදාගොඩ" "විහාරමන්දිරය" ඇතුලු ඓතිහාසික බෞද්ධ නෂ්ටාවශේෂ බොහොමයක් මෙහි ඇති බැවින් මෙය සුවිශේෂී ස්ථානයක් වේ. තවද මෙම ප්‍රදේශයෙහි ගල්කණු, විවිධ ප්‍රමාණයේ ගල්ලෙන්, ලෙන් කටාරම්, බ්‍රාහ්මී අක්ෂරයන් පිහිටුවන ලද ශීලා ලිපි ආදියද දක්නට ලැබේ.

විල්පත්තු ප්‍රදේශයට අයත් පොම්පාරිප්පු ප්‍රදේශයද පුරා විද්‍යාත්මක වැදගත්කමින් යුක්ත වූ ප්‍රදේශයක් වේ.මෙම ප්‍රදේශය කැණීම් සඳහා තෝරා ගැනිමට මූලික ලෙස බලපාන ලද්දේ,

1) මෙය ඉන්දියානු භූමියට ඉතා ආසන්නව පිහිටීමත් එමනිසා වරාය හා උතුරු ඉන්දියානු වෙරළේ සිට ඒ පෙදෙස් දෙක අතර නිරන්තරයෙන් පැවතුනා වූ සංස්කෘතික හා වෙළඳ සබඳතාව නිසා දිවයිනේ සංස්කෘතියේ ඒ ඒ කාලපරිඡ්දයන් තුල සිදු වූ දැ පිළිබඳ විශ්වාසනීය දත්ත ලබා ගැනිමත් සඳහා

11) කෘෂිකාර්මික ප්‍රජා සංක්‍රමණය විම හා පදිංචි විමට නිරන්තරයෙන් හේතු වූ පාරිසරික විද්‍යාත්මක සමාන බවක් පෙන්න විමත්ය.

මෙම ප්‍රදේශය, දිවයිනේ උතුරු පෙදෙස් බටහිර වෙරළ ආසන්නයේ පිහිටි ප්‍රාග් ඓතිහාසික සුසාන භූමියක් ලෙසට ප්‍රකටය. මෙය එකම වියළි කලාපයක පිහිටා ඇති දැනට වන ආරක්ෂක ස්ථානයකි. පුත්තලමේ සිට ඉලවන්කුලම දක්වා වැටි ඇති මාර්ගයකින්ද මෙම ස්ථානයට ලගා විය හැක. මෙහි දකුණින් කලා ඔයත් නැගෙනහිරින් පුරාතන ගල්ගේ විහාරයත් වේ. පොම්පාරිප්පු හි බොහෝ දුරට සුසාන භූමි ව්‍යාප්ත වී තිබේ. මෙහි කරණ ලද කැණීම් වලින් අළුබඳුන් ආදි වැළලුණු ද්‍රව්‍යද සොයාගෙන ඇත. මෙලෙස කරන ලද පර්යේෂණ තුලින් එකල සිටි ජනතාවගේ තාක්ෂණික දැනුම පිලිබඳව යම් අදහසක් ලබා ගැනිමට හැකි වී තිබේ. තවද කුදිරමලෙයි තුඩුවේ ඉපැරණි කෝවිලක නටඹුන් තිබී හමු වී ඇති අතර නාවික ගමනාගමනය සඳහා යොදා ගන්නා ලද පළගතුරෙයි වරායක නටඹුන්ද හමු වී ඇත. වාර්ෂික පූජා පවත්වන ඉපැරණි පල්ලියක් අදද දක්නට ලැබේ.ඉහත තොරතුරු අනුව පෙනී යන්නේ ඉතා වැදගත් ඓතිහාසික වාර්තා හා මූලා අභිලේඛන හා පුරාණ ක්ෂේත්‍ර , ස්මාරක සහ මානව සංස්කෘතිකාංග රැසක් විල්පත්තුව ප්‍රදේශයේ සැගවී ඇති බවය. එම නිසා ශ්‍රී ලංකාවේ පැරණිතම හා වඩා වැදගත්ම රක්ෂිත ප්‍රදේශ අතර විල්පත්තු ජාතික උද්‍යානයට ප්‍රමුඛස්ථානයක් ලැබේ.

තවද මෙහි වෘක්ෂලතා හා සත්ත්වයින් පිළිබඳව සලකා බැලුව හොත් , බටහිර පවතින වනාන්තර , ලැහැබ, තණබිම්, සහ උද්‍යාන මධ්‍යයේ පවතින විල්ලු සහ කාණු පද්ධති නිසා මෙවැනි පරිසර වල ජෛවී විවිධත්වය හා පාරිසර විද්‍යාත්මක අතින් ඉහල අගයක් ගනි. මෙහි ක්ෂීරපායි විශේෂ 31ක් හදුනාගෙන ඇති ඒ අතර මී සහ වවුල් විශේෂද ජිවත් වෙති.මෙහි තර්ජනයට ලක් වී ඇති ක්ෂිරපායි විශේෂ වන්නේ අලියා, වළසා, දිවියා සහා කුළු හරකා යන සත්ත්වයින්ය. ශාක භක්ෂකයින් අතරින් සංඛ්‍යාවෙන් අඩුම සනත්වයක් පෙන්වන්නේ “අලියා“ වන අතර ප්‍රථම ස්ථානයට සලකන්නේ “තිත් මුවා” වෙ. තිත් මුවන් සංඛ්‍යාත්මක වශයෙන් 3,500ක් පමණ වේ. මේ අතර ජාතික වනෝද්‍යානයේ අභය භූමි කළමණාකරණය යටතේ, මැතකදි තණකොළ වැවිම ආදිය මගින් අලින්ගේ වාසභූමි ඒ සතුනට සුදුසු වාසභූමි බවට පත්කිරිමට උත්සාහ ගෙන ඇත. තවද දේශිය මෙන්ම සාංක්‍රමණික පක්ෂින්ගේ ගහණද මෙහිදි දැක ගත හැක.

  

මෙම ප්‍රදේශයේ ඇති වෘක්ෂලතා පිළිබඳව සලකා බැලීමේදී , වෙරළ තිරයට යාබදව පිහිටි කරදිය තණබිම, පහත් ලැහැබ සහ වෙරළාශ්‍රිත වෘක්ෂලතා ලෙස වෘක්ෂ ලතා වර්ග 3කි. උද්‍යානයෙන් 73%ක් පමණ වනාන්තරයේ හෝ ලැහැබ වලින් සමන්විත වන අතර ඉතිරිය විවෘත වාසභූමියක් ලෙස පවතී. කිලෝමීටර් 5-10ක් අතර වූ වෙරල තීරය අඩු උසකින් යුක්ත වන අතර භූමිය අභ්‍යන්තරයට වත්ම වෘක්ෂ සහිත වැසි වනාන්තර හමු වේ.

උද්‍යානයේ බටහිර අශ්‍රිත ප්‍රමුඛ ශාක විශේෂ ලෙස වල්ඉදි, උංචි, තෙල්කදුරු, කොළං, වැවරණ, හල්මිල්ල, බුරුත, ලෝලු, කළුවර, දළුක්, වීර, පලු, කෝන්, මහදන්, මිල්ල, කිරිකොන් වන අතර,
පඳුරු ශාක ලෙස හීරස්ස, දමනිය, බූ කොම්බෑ,කරපිංචා, නෙල්ලි, උල්කෙන්ද , කුකුරුමාන ද,
තෘණ හා පැළෑටි ශාක ලෙස තෝර, මයුර තණ, හීන් තණ ආදිය හඳුනා ගත හැක.

මෙලෙස සෞන්දර්යාත්මක ඓතිහාසික වටිනාකමින් යුක්ත වූ විල්පත්තු උද්‍යානය අතීතයේ සිදු වූ ත්‍රස්තවාදි කටයුතු නිසාත්, යුධමය හේතූන් මත තනවා ඇති වැඩි දියුණු කරන ලද මාර්ග නිසාත්, ඉතාම සංවිධානාත්මකව කරනු ලබන නීති විරෝධි දැව කැපීම් සහා දඩයම් කිරීම් ආදිය නිසාත් යම් තරමක හානියකට ලක් විය. ඒසේම උද්‍යානය ආශ්‍රිත ගම්බිම් ව්‍යාප්ත විමද වනෝද්‍යානයේ ඒකීයකරණයට තර්ජනයක් වූ අතර ප්‍රතිසංස්කරණය කරවන ලද මහා අන්දරගොල්ලෑව හා මහාවැව ජලාශ වල ආක්‍රමණික ශාඛ වර්ධනය වීමත් වනජීවියනට අයහපතක්ම වි ඇත.

එසේම විල්පත්තු ජාතික උද්‍යානය හුණුවිල ගම පිහිටි උද්‍යාන මූලස්ථානයෙන් පාලනය කරන අතර පාරිසරික සංචාරක කටයුතුද සාර්ථකව ක්‍රියාත්මක කෙරේ.

**කතෘ -** දම්මිකා මල්සිංහ, අතිරේක ලේකම් (ව්‍යාපෘති) , වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**උද්‍යානය පිළිබඳව විස්තර-** හසිනි සරත්චන්ද්‍ර, ප්‍රධාන මාධ්‍ය නිලධාරි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**දෙමළ පරිවර්තනය-** ඒ.ආර්.එෆ්. රිෆ්නා, සංවර්ධන නිලධාරි, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**ඉංග්‍රීසි පරිවර්තනය (වාර්තා හා කරුණු)-** අසෝක පලිහවඩන, පරිවර්ථක, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**ඉංග්‍රීසි පරිවර්ථනය (කථාව)-** තානුක මල්සිංහ

**වෙබ් අඩවි සැකසුම-** එන්.අයි.ගයත්‍රි, සංවර්ධන නිලධාරි, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**ඡායාරූප-** රෝහිත ගුණවර්ධන, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**සිංහල යතුරු ලියන හා අනෙකුත් සහාය-** අරුණි පලාපත්වල, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය